


# අවභාවිතාකරන ලෝක සිතියමක්

## වසර 450 ක් තිස්සේ බටහිර ජාතීන් හිතාමතාම අවභාවිතා කරන මර්කේටර්ගේ ලෝක සිතියම අපි තවමත් භාවිත කරමු....!




ක්‍රි.ව 1512 දී උපත ලද ජර්මන් ජාතික ජෙරාඩ් මර්කේටර් (GERARDUS MERCATOR) ලෝකයේම අවධානයට ලක් වන්නේ වසර 1569 දී ඉතා ප්‍රසිද්ධියට පත් වූ ලෝක සිතියමේ නිර්මාතෘ වශයෙනි.

රෝම අධිරාජ්‍යය විසින් අත්පත් කරගනු ලැබූ ඊජිප්තුවේදී ක්‍රි.ව 100 දී පමණ උපත ලද ක්ලෝඩියස් ටොලමි (CLAUDUIS PTOLEMY) නිර්මානය කල ලෝක සිතියම් කිහිපයක් ඒ වන විට භාවිතයේ තිබුනද ඒ කිසිවක් අංග සම්පූර්ණ ඒවා නොවීය. එයට බලපෑ ප්‍රධාන සාධකය වූයේ එවකට අත්ලන්තික් සාගරය හා ශාන්තිකර සාගරයේ අතර පිහිටා තිබුණු ගොඩබිමක් ගැන කිසිදු හෝඩුවක් නාවිකයෙකු හට හෝ දේශගවේෂකයෙකු හට ලැබී නොතිබිමයි.

ටොලමිගේ ලෝක සිතියම



වසර 1492 - 1502 අතර කාලය තුල ක්‍රිස්ටෝපර් කොලොම්ස් (CHRISTOPHER COLOMBUS) කිහිපවරක්ම උතුරු ඇමරිකාවට සහ දකුණු ඇ-මෙරිකාවට ළගාවූ පසු එම දත්තද උපයෝගී කරගෙන සාර්ථක ලෝක සිතියමක් නිර්මාණය කරන්නට මර්කේටර්ට හැකි වුණි. (වසර 1506 දී කොලම්බයේ මිය යන තුරුම සිතා සිටියේ තමා ලගා වූයේ ඉන්දියාවට බව මෙහිලා කිව යුතුයි.) මර්කේටර් මුලින්ම නිර්මාණය කළේ සිතියම සහිත ලෝක ගෝලයයි. ඉන්පසු ඔහු නිර්මාණය කළ ලෝක සිතියම සහිත බිත්ති පෝස්ටරය යුරෝපය පුරා ඉතා විශාල ලෙස අලෙවි අතර මර්කේටර් මහ ධනපතියෙකු කරන්නටද එය සමත් විය.




මර්කේටර්ගේ සිලින්ඩරාකාර සිතියම් ප්‍රක්ෂේපණය

ගෝලයක මුද්‍රණය වූ සිතියම වඩා පැහැදිලි සමතලයක මුද්‍රණය තෙන් දී ඇතිවන විකෘතිතාවය මකාලීමට මර්කේටර් සොයාගත් විසඳුම වූයේ ගෝලයේ ධ්‍රැව දෙපසින් සිලින්ඩරාකාරව විහිදී යන සේ සිතියම නිර්මාණය කිරිමයි.

මෙම නවතම ලෝක සිතියම නාවික ගමන් වලදී මහගු ලෙස උපකාරී වූ අතර ඒ නිසාම එය යුරෝපය පුරා වඩාත් ජනප්‍රිය වුණි.

මර්කේටර්ගේ ලෝක සිතියම ක්‍රමයෙන් ලොව පුරාම ප්‍රචලිත වූ අතර, තවත් වසර තුන්සිය පනහක් යන තුරුත් එය කිසිවෙකුගේ විවේචනයට භාජනය වූයේ නැත.

මර්කේටර්ගේ ලෝක සිතියම



නියම ප්‍රශ්නය ආරම්භ වන්නේ වසර 1900 ක් පසුවය.

අන්තර් ජාතික සිතියම් ගත කිරිමේ සහ හැදෑරීමේ සංගමයේ (International Carto-graphic Association) මෙනෝ - යාන් ක්‍රාක් (Menno – Jan Kraak) ඒ සම්බන්ධයෙන් මෙවැන්නකි.

"බොහෝ පාසල් වල භූගෝලය විෂයය උගන්වන්නට භාවිතයට ගත්තේ මර්කේටර්ගේ ලෝක සිතියම. අපි කුඩා කළ සිටම හැදෑරුවේ උස් මහත් වුනේ අපිට හුරු පුරුදු මේ ලෝක සිතියමත් සමගින්."

මර්කේටර්ගේ ලෝක සිතියමට අනුව නිරක්ෂ රේඛාව මත හෝ ඊට ආසන්නව පිහටා තිබෙන රටවල විශාලත්වය සහ හැඩය නිවැරදි වුවද ඔහුගේ සිලින්ඩරාකාර සිතියම් ප්‍රක්ෂේපණය හේතුවෙන් උත්තර ධ්‍රැවය හා දක්ෂිණ ධ්‍රැවය දෙපසට වන්නට පිහටා තිබෙන රටවල් විශාලත්වය සහ හැඩය ඉතා බරපතල ලෙස විකෘති වී ඇති බව දන්නේ ලොව ජනගහනයෙන් කී දෙනාද ?

මේ තිබෙන්නේ අප අදටත් භාවිතයට ගන්නා අපට හුරු පුරුදු මර්කේටර්ගේ විකෘති වූ ලෝක සිතියමෙන් ගත් නිදර්ශන කිහිපයකි.

මර්කේටර්ගේ ලෝක සිතියමට අනුව පෙන්වා ඇති රටවල් කීපයක විශාලත්වයන් හා ඒ ඒ රටවල සැබෑ විශාලත්වයක් අපි දැන් සංසන්දනය කරමු.

(මේ රටවල් අප්‍රිකාව හා සංසන්දනය කරනු ලබන්නේ නිරක්ෂ රේඛාව මත පිහිටා තිබෙන අප්‍රිකාව මර්කේටර් ලෝක සිතියමේ වඩාත් නිවැරදිව දක්වා ඇති හෙයිනි.)

### ඇමෙරිකා එක්සත් ජනපදය




(සැබෑ ප්‍රමාණයට වඩා විශාලව මර්කේටර් ලෝක සිතියමේ දක්වා ඇත.)

### චීනය




(සැබෑ ප්‍රමාණයට වඩා විශාලව මර්කේටර් ලෝක සිතියමේ දක්වා ඇත.)